සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

11 ශ්‍රේණිය | **පෙරදිග සංගීතය - I** | කාලය පැය 01 යි

නම/ විභාග අංකයː

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. සගරි සරි, රිමග රිග, ............ මෙම ආරෝහණ ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර රටාව තෝරන්න.
    (1) ග ස රි ග ම (2) ග රි ග ස ග
    (3) ග ප ම ග රි (4) ග ප ම ග ම

02. විකෘති ස්වර ඇතුළත් නිර්දේශිත රාග යුගලය කුමක් ද?
    (1) කාෆි - බිලාවල් (2) කාෆි - භෛරවී
    (3) යමන් - භූපාලි (4) භෛරවී - බිලාවල්

03. ථාථයේ හෝ මේලයේ නමින් නම් **නොකරන** රාගය කුමක් ද?
    (1) භූපාලි (2) බිලාවල්
    (3) කාෆි (4) භෛරවී

04. ධෛවතය හා ගාන්ධාරය යන ස්වර ප්‍රබල ලෙස යොදාගන්නා රාග යුගලය තෝරන්න.
    (1) බිලාවල් - කාෆි (2) භූපාලි - භෛරවී
    (3) භෛරවී - යමන් (4) බිලාවල් - භූපාලි

05 "සර්ව කාලීන" රාගය ලෙස හඳුන්වන්නේ,
    (1) භෛරවී රාගය යි. (2) බිලාවල් රාගය යි.
    (3) කාෆි රාගය යි. (4) භූපාලි රාගය යි.

06. රාගයක ශුද්ධ නිෂාදය හා සම්බන්ධයෙන් වූ <u>අසත්‍ය</u> ප්‍රකාශය තෝරන්න.
    (1) භූපාලි රාගයේ වර්ජිත ස්වරයකි (2) භෛරවී රාගයේ විවාදී ස්වරයකි.
    (3) යමන් රාගයේ සංවාදී ස්වරයකි. (4) කාෆි රාගයේ වාදී ස්වරයකි.

07. අවම අනුවාදී ස්වර සංඛ්‍යාවක් සහිත රාගය කුමක් ද?
    (1) බිලාවල් (2) භූපාලි
    (3) යමන් (4) කාෆි

08. යමන් රාගයට අයත් ස්වර සංගතියක් නිවැරදි ලෙස පෙන්නුම් කරන වරණය කුමක් ද?
    (1) මග මරි සරිස (2) රිපමප මගුරි
    (3) ගපධස් ධපග (4) නිරිගරි පරිස

09. "ගග පධස්" මෙම ස්වර සංගතිය යොදා ගත හැකි රාගය තෝරන්න.
    (1) භූපාලි (2) බිලාවල් (3) කාෆි (4) භෛරවී

10. ස්වර සප්තකයට අයත් ස්වර 12 ගැන සැලකීමේදී ශුද්ධ මධ්‍යමයට දෙපසින් පිහිටන ස්වර දෙක මොනවා ද?
    (1) ශුද්ධ ගාන්ධාරය - පංචමය (2) ශුද්ධ ගාන්ධාරය - තීව්‍ර මධ්‍යමය
    (3) තීව්‍ර මධ්‍යමය - පංචමය (4) පංචමය - කෝමල ධෛවතය

11. ''ස්වර මාලිකා'' ලෙස හඳුන්වන රාගධාරී ගායන/ වාදන ප්‍රබන්ධ විශේෂය තෝරන්න.

(1) ලක්ෂණ ගී (2) ඛ්‍යාල්

(3) ගත් (4) සර්ගම්

12. තබ්ලාවෙන් වැයෙන ''න'' අක්ෂරය භාවිතා **නොවන** හින්දුස්ථානි තාලය තෝරන්න.

(1) දාදරා තාලය (2) ඣප් තාලය

(3) ත්‍රි තාලය (4) කෙහෙර්වා තාලය

13. ''ධ ප ග ස'' යන ස්වර හතරෙන් ස්වර තුනක් යොදාගනිමින් වාදනය කළ හැකි කෝඩ්ස් දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A major - G major (2) A minor - G minor

(3) G minor - C major (4) A minor - C major

14. පහත සඳහන් වාද්‍ය භාණ්ඩ අතරින් හින්දුස්ථානී සංගීත පද්ධතියට ආවේණික නොවන භාණ්ඩය තෝරන්න.

(1) එස්රාජය (2) වීණාව (3) සිතාරය (4) සාරංගිය

15. තත්, සුෂිර, අවනද්ධ යන හින්දුස්ථානී සංගීත භාණ්ඩ වර්ග තුනට අයත් සංගීත භාණ්ඩ තුනක් සඳහා ප්‍රවීණත්වයක් දරන සංගීතඥයින්ගේ නම් පිළිවෙලින් ඇතුළත් වරණය තෝරන්න.

(1) රවි ශංකර්, හරිප්‍රසාද් චෞරසියා, ශකීර් හුසේන් (2) ශකීර් හුසේන්, හරි ප්‍රසාද් චෞරසියා, රවි ශංකර්

(3) අල්ලා රබ්බා, රවි ශංකර්, ශකීර් හුසේන් (4) හරිප්‍රසාද් චෞරසියා, ශකීර් හුසේන්, රවි ශංකර්

16. අළුව, කඩිප්පුව හා මිස්රාබය යන උපකරණ වලින් පමණක් වැයීමට හැකි සංගීත භාණ්ඩ පිළිවෙලින් නම් කර ඇති වරණය කුමක් ද?

(1) එස්රාජය, දවුල, සිතාරය (2) වයලීනය, තම්මැට්ටම, වියෝලාව

(3) වියෝලාව, ගැටබෙරය, සිතාරය (4) වයලීනය, තම්මැට්ටම, සිතාරය

17. ස්වර පිහිටීම සමාන වන සංගීත භාණ්ඩ යුගලය තෝරන්න.

(1) වයලීනය - එස්රාජය (2) එස්රාජය - සිතාරය

(3) සිතාරය - ගිටාරය (4) එස්රාජය - මැන්ඩලීනය

18. කණ්ඩායම් ගී වර්ගයට අයත් ගීත ඇතුළත් වරණය තෝරන්න.

(1) බැස සීතල ගඟුලේ - දූඩිකළ මාතා (2) සිනිඳු සුදු මුතු - ඕලු නෙළුම් නෙරිය රඟාලා

(3) සුවඳ පද්ම ඕලු ආදි - දන්නෝ බුදුන්ගේ (4) මුළු ගතම වෙහෙසුනා - මංගෝ කළු නැන්දේ

19. කපිරිඤ්ඤා ගී තනු ආභාසයෙන් නිර්මාණය වී ඇති ගීත දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) දන්න වංහුං අප කන්නසාමි - මෙම ගිම්හාන (2) රස ආහාර කවලා - මී වදයකි ජීවිතේ

(3) රතඳර සිරියා පරදන - ආලේ බැන්ද මාගේ රම්‍යවන් (4) ලෝ පසිඳු - යානත ඇතුල මල් පෙති

20. ගුත්තිල කාව්‍යයේ එන ගීත අතරින් මාත්‍රා හතරේ රිද්ම රටාව අනුව ගායනය කළ හැකි ගී පාදය කුමක් ද?

(1) මනමත් කරවන දන මුළු දෙරණා (2) රැගත් සුරා පිරූ විතින්

(3) රූ රුසේ අඳිනා ලෙසේ (4) පුන් මදාරා මල් දමින්

21. "තන්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා ....." මෙම ගී පාදය අයත්වන ගැමි ගී විශේෂය තෝරන්න.

(1) ආසාතාත්මක - මෙහෙ ගී (2) ආසාතාත්මක - සමාජයීය ගී

(3) අනාසාතාත්මක - මෙහෙ ගී (4) අනාසාතාත්මක - ඇදහිලි ගී

22. "බුද්ධං සරණේ සිරස දරාගෙන" මෙම ගැමි ගී පාදයේ ඇතුළත් සඳැස්මත් ගණන,

(1) 14 කි. (2) 15 කි. (3) 16 කි. (4) 17 කි.

23. දේශීය පංචතූර්ය සංගීත භාණ්ඩ වර්ගීකරණයේදී තාල පට (තාලම්පට) අයත් වන්නේ කුමන වර්ගයට ද?

(1) සුෂිර (2) ඝන (3) විතත (4) ආතත

24. සබරගමු වන්නම් අංගයක් වන්නේ,

(1) කස්තිරම (2) ඉරට්ටිය (3) කලාසම (4) සීරුමාරුව

25. මැදුම් තනි තිතට හා දෙසුළු මැදුම් තුන් තිත යන තිත් රූප දෙකට අනුව ගායනා කරන වන්නම තෝරන්න.

(1) උකුසා වන්නම (2) තුරඟා වන්නම

(3) පහතරට සින්දු වන්නම (4) කෝකිල වන්නම

26. "අප ගුණ සරු සිංහල භූපති" යන නූර්ති ගීතයේ තනුව නිර්මාණයට පාදක කරගත් රාගය කුමක් ද?

(1) භෛරවී රාගය (2) භූපාලි රාගය (3) කාෆි රාගය (4) බිලාවල් රාගය

27. අලගනායිදු හා අබ්දුල් සතාර් යන සංගීතඥයින්ගේ දායකත්වය ලැබුණු රංග ශෛලීන් දෙක පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.

(1) කෝලම් - නාඩගම් (2) නාඩගම් - නූර්ති

(3) නූර්ති - නාඩගම් (4) කෝලම් - නූර්ති

- අංක 28 සිට 29 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ස්වර පුවරු ආකෘතිය උපකාරී කරගන්න.




28. ඉහත ස්වර පුවරු ආකෘතියේ අංක 1,3,5,6,8,10,12,13 යන ස්වර අයත් බටහිර සංගීත ස්කේලය (Scale) කුමක් ද?

(1) F major ස්කේලයයි. (2) G major ස්කේලයයි.

(3) C major ස්කේලයයි. (4) $B^b$ major ස්කේලයයි.

29. ඉහත ස්වර පුවරු ආකෘතියේ අංක 15, 19 හා 22 යන යතුරු එකවර වාදනය කළ විට ලැබෙන කෝර්ඩ් (Chord) එක වනුයේ,

(1) C major (2) C minor (3) F major (4) G major

30. /ස - රි - / ග - - - / ග - රි - / ස - - - / යන ස්වර (Melody) තනුව සඳහා සුසංගත වීමට (Harmony) වඩාත්ම ගැළපෙන ස්වර මාලාව තෝරන්න.

(1) /ග - ම - / රි - - - / ම - ප - / රි - - - / (2) /ග - ප - / ම - - - / ම - ප - / රි - - - /

(3) /ග - ම - / ප - - - / ප - ම - / ග - - - / (4) / ග - ම - / රි - - - / ම - ප - / ග - - - /

- අංක 31 සිට 32 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් අපරදිග සංගීත ප්‍රස්තාර කොටස උපයෝගී කරගන්න.



31. ඉහත අපරදිග සංගීත ප්‍රස්තාරයේ සඳහන් කී සිග්නේචරය (key signature) මගින් පෙන්නුම් කරන ස්කේලය කුමක් ද?

(1) C major (2) C minor (3) G major (4) G minor

32. ඉහත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පරිවර්තනය කළ විට ලැබෙන නිවැරදි තනුව තෝරන්න.

(1) /ප - ම / ම ප - / ගම පනි ස්රි් / නිප ගරි ස
(2) /ප - ම' / - ප - / ගම' පධ නිස් / නිධ පම' ප
(3) /ප - ම' / - ප - / ගුම පධු නිස් / නිධු පම' ප
(4) /ප - ම' / -ම ප - / ගම' පධ නිස් / නිධ පම' ප

33. "රතු හැට්ටකාරි" සහ "කුස පබාවතී" යන නාට්‍යවල ගැයෙන ගීත දෙකක පද පිළිවෙලින් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) යස ඉසුරු - රතඳර සිරි පරදන
(2) අප මුණි සඳ - සෝබාව දේ
(3) රස බොජුනක් නැතත් - අපි කිරිල්ලියෝ
(4) සුවඳ සබන් - අප මුණි සඳ

34. අපරදිග සංගීතඥ අමදියෙස් මොසාර්ට් විසින් රචිත සංධ්වනියක් (Symphony) වන්නේ මින් කුමක් ද?

(1) එරොයිකා (2) පැස්ටොරල් (3) කෝරල් (4) ජුපිටර්

35. අවනද්ධ පද, තිහායි හා චක්‍රදාර් වැනි ශිල්පාංග වැඩිවශයෙන් ඇතුළත් වන්නේ පහත සඳහන් කුමන ගීත තුළ ද?

(1) ග්‍රැමෆෝන් ගී (2) කපිරිඤ්ඤා ගී (3) රාගාශ්‍රිත සරල ගී (4) කණ්ඩායම් ගී

36. MIDI (මිඩි) යනුවෙන් අදහස් කරන්නේ,

(1) සංගීතය නිර්මාණය කිරීම සඳහා වූ මෘදුකාංගයකි.
(2) සංගීතය පටිගත කිරීම සඳහා වූ මෘදුකාංගයකි.
(3) සංගීතමය නාද විද්‍යුත් අංකිත ක්‍රමයට හුවමාරු කරගැනීමේ ක්‍රමයකි.
(4) සංගීතමය තොරතුරු විශ්ව කෝෂය හරහා අධ්‍යයනය කරගැනීමකි.

37. නාඩගම් ශෛලිය <u>අනුගමනය කර නැති</u> නව නාට්‍යය තෝරන්න.

(1) මනමේ (2) කාලගෝල (3) නරි බෑණා (4) සිංහබාහු

38. පෙරදිග සංගීතයේ පර්දා සහිතව වැයෙන (Fret) හා අපරදිග සංගීතයේ පර්දා රහිතව වැයෙන (Fretless) සංගීත භාණ්ඩ දෙක පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.

(1) සිතාරය - ගිටාරය
(2) දිල්රුබාව - වයලීනය
(3) එස්රාජය - මැන්ඩලීනය
(4) සිතාරය - මැන්ඩලීනය

39. දේශීය ජන සංගීතය ඇසුරෙන් සංගීත නිර්මාණකරණයේ යෙදුණු සංගීතඥයෙකු වන්නේ,

(1) ලයනල් එදිරිසිංහ මහතා ය.
(2) ආනන්ද සමරකෝන් මහතා ය.
(3) සුනිල් ශාන්ත මහතා ය.
(4) ඩබ්. බී. මකුලොලුව මහතා ය.

40. මධ්‍ය ස ස්වරයේ සංඛ්‍යාතය 256Hz නම් මධ්‍යමයේ හා පංචමයේ සංඛ්‍යාතයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) 340Hz - 384Hz (2) 430Hz - 426Hz (3) 384Hz - 426Hz (4) 426Hz - 512Hz

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය - II | කාලය පැය 02 යි.

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

01 අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''නි̣ ස ග ම ධ ප'' ලෙස ස්වර සංගතිය යෙදෙන රාගය නම් කරන්න. (ල. 01)

(ii) වර්ජිත ස්වර දෙකක් සහිත නිර්දේශිත රාගයේ ථාඨය/ මේලය නම් කරන්න. (ල. 01)

(iii) ''නි̣ රි ග, ප රි ස'' ලෙස ස්වර ඇතුළත් රාගයේ මුඛ්‍යාංගය ලියන්න. (ල. 01)

(iv) විභාග 04 කින් යුත් නිර්දේශිත හින්දුස්ථානි තාලයක තාල සංඥා පිළිවෙලින් සලකුණු කරන්න. (ල. 01)

- අංක (v) සිට (viii) දක්වා ප්‍රශ්න යටතේ දී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංක ද සමග ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(v) බොක්ස් ගිටාරයක තත් හය සුසර කරනු ලබන්නේ .......................................... යන ස්වර වලට ය. (ල. 01)

(vi) උඩරට වන්නමක කොටස් ගණන ....................................................................................................... කි. (ල. 01)

(vii) 'නෙයිනගෙ සූදුව' නම් විරිඳු ගායනය සහිත ජවනිකාව ඇතුළත් වන්නේ .............................................. නම් වේදිකා නාට්‍යයේ ය. (ල. 01)

(viii) ම ධ ස ($FA^bC$) යන ස්වර සංචය .......................................... chord (කෝර්ඩ්) ලෙස නම් කළ හැකි ය. (ල. 01)

- අංක (ix) හා (x) ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්න අංක ද සමග ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ix) කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් ........................................ වන්නම් රචනා කර ඇති බව සඳහන් වන අතර, "සේවිත පාද සරෝරුහ ..." යනුවෙන් ගැයෙන වන්නම ............................ දෙතිතට අනුව ගායනය කරයි. (ල. 02)

(x) "සිරි බුද්ධ ගයා විහාරේ ..." මෙම ගීතය ...................................... ගීත වර්ගයට අයත්වන අතර, මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයක් වූ "ඇසේ මධුර ජීවනයේ" ගීතය ................................................... ශූරීන් විසින් නිර්මාණය කර ඇත. (ල. 01)

(ලකුණු 12)

(02) පහත වගුවෙහි දැක්වෙන විස්තර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රාගය | රාග විස්තරය |
|---|---|
| A | විවාදී ස්වර 5 ක් යොදාගත හැකි මෙම රාගයේ මධ්‍යමය වාදී ස්වරය වේ. |
| B | කල්‍යාණ මේලයෙන්/ථාඨයෙන් බිහිවන මෙම රාගයේ නිෂාධය සංවාදී ස්වරය ලෙස යෙදේ. |

(i) ඉහත විස්තරවලට අනුව A සහ B යන අක්ෂරවලට ගැලපෙන රාග දෙක පිළිවෙලින් නම් කරන්න.(ල. 02)

(ii) ඉහත රාග දෙකෙන් එක් රාගයක් තෝරාගෙන ඊට අයත්

- මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ ලක්ෂණ ගීතයක **ස්ථායි** කොටසේ ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න.

නැතහොත්

- මධ්‍යලය වාදිතයක **ස්ථායි** කොටස ස්වර ප්‍රස්තාර කර **මාත්‍රා අටකට** නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ල. 06)

(iii) ඉහත (ii) කොටසේදී **තෝරා නොගත්** රාගයට අයත්

- ආරෝහණ, අවරෝහණ ස්වර
- රාග ජාතිය හා අනුවාදී ස්වර ලියා දක්වන්න. (ල. 04)

(03) (i) හින්දුස්ථානි රාගධාරී සංගීතයෙහි ලක්ෂණ ගීතවල ඇතුළත් සුවිශේෂී ගුණාංග 02ක් ලියන්න. (ලකුණු 02)

(ii) දීප්චන්දි තාලයේ ඨේකාව නියමිත මාත්‍රා විභාග අනුව තාල සංකේත ද සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) විකෘති ස්වර නොයෙදෙන රාගයක් නම්කර, ඊට අදාළ ස්වර රචනාවක්, ත්‍රිතාලයේ ආවර්ත දෙකක් සම්පූර්ණ වන අයුරින් නිර්මාණය කරන්න. (ලකුණු 06)

(04) (i) සේ ගී යටතට ගැනෙන ගී වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ගොයම් ගී, පැල් ගී යන ගී වර්ග දෙකෙහි සුවිශේෂී ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) නිර්දේශිත බැති ගීයක හෝ කෙලි ගීයක ගී පාද දෙකක් පමණක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ඊට අදාළ තිත ද නම් කරන්න. (ලකුණු 05)

(05) (i) නූර්ති හා නාඩගම් රංග ශෛලීන් සම්බන්ධව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a. ආභාසය කරගත් සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

b. ප්‍රධාන සංගීත භාණ්ඩ එක බැගින් නම් කරන්න.

c. ඉහත ශෛලීන් දෙක සඳහා සංගීතය සැපයූ සංගීතඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 06)

(ii) පහත සඳහන් පාරිභාෂිත වචන අතුරෙන් තෝරාගත් **දෙකක්** පිළිබඳ ව කෙටි විස්තර සපයන්න.

- දොහොරාව • උරුට්ටුව • පොතේ ගුරු (ලකුණු 02)

(iii) නූර්ති හෝ නාඩගම් ගීතයක මුල් කොටසේ ගී පද ලියා ගීතය නම් කරන්න. (ලකුණු 04)

(06) • පහතින් දක්වා ඇත්තේ ප්‍රචලිත ජන ගී නාද මාලාවකට අයත් අපරදිග සංගීත ප්‍රස්තාරයකි.



(i) ඉහත බටහිර සංගීත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(ii) එම පෙරදිග ක්‍රමයට ලියූ ස්වර ප්‍රස්තාරයේ මුල් විභාග හතර මධ්‍යම භාවයට පෙරලා නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 02)

(iii) පහත A, B, C හා D යන අක්ෂරයන්ගෙන් දැක්වෙන අපරදිග සංගීත ප්‍රස්තාර සංකේත නම් කරන්න. (ලකුණු 04)




(07) පහත සඳහන් ප්‍රශ්න අනු අංක අතුරෙන් එකකට පිළිතුරු සපයන්න

(i) • ලයනල් රන්වල • සී. ද එස්. කුලතිලක • රෝහණ බැද්දගේ
යන සංගීතඥයින් අතරින් එක් සංගීතඥයකුගේ සංගීත සේවාව පිළිබඳ විස්තරයක් සපයන්න.

(ii) ධ්වනි ගුණය හා තාරතාවය යන සංකල්ප දෙක පිළිබඳ උදාහරණ සහිත ව විස්තරයක් සපයන්න.

(ii) Multi Track Recording සඳහා යොදා ගත හැකි මෘදුකාංග දෙකක් නම් කරන්න.
ගීත පටිගත කරගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න.

(iv) ගැමි ගී නිර්මාණයට පදනම් වූ කරුණු තුන නම් කර, එම ගී වර්ග තුනට අදාළ ගීත තුනක මුල් පාද උදාහරණ ලෙස සඳහන් කරන්න. (මාතෘකා 01ක් ලිවීමට = 12යි.)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(2) | 3 -(1) | 4 -(4) | 5 -(1) | 6 -(4) | 7 -(2) | 8 -(4) | 9 -(1) | 10 -(2) |
| 11-(4) | 12 -(3) | 13 -(4) | 14 -(2) | 15 -(1) | 16 -(4) | 17 -(2) | 18 -(4) | 19 -(2) | 20 -(1) |
| 21-(3) | 22 -(3) | 23 -(2) | 24 -(3) | 25 -(4) | 26 -(1) | 27 -(2) | 28 -(1) | 29 -(4) | 30 -(3) |
| 31-(3) | 32 -(2) | 33 -(1) | 34 -(4) | 35 -(3) | 36 -(3) | 37 -(3) | 38 -(2) | 39 -(4) | 40 -(1) |

(එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමිවේ.)

**II පත්‍රය**

(01) (i) භෛරවී රාගය (ii) කල්‍යාන ථාටය/ කල්‍යාන මේලය (iii) නි රි ග රි ස, ප ම් ග රි ස
(iv) x ,2,0,3 (v) ග ධ රි ප නි ගං / ගං නි ප රි ධ ග / $E^b A^5 D^4 G^3 B^2 E^1$ (vi) 6කි/ හයකි
(vii) මධුර ජවනිකා (viii) F minor / F මයිනර් (ix) පහතරට සින්දු වන්නම්, මැදුම් මහ
(x) ග්‍රැමෆෝන් - ආනන්ද සමරකෝන්
i සිට viii දක්වා නිවැරදි පිළිතුරුවලට ලකුණු 01 බැගින් ලකුණු 08 ක් ද,
ix හා x යන ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ලකුණු 04ක් ද ලෙස ලකුණු 12

(02) (i) A - භෛරවී රාගය, B - යමන් රාගය (ල. 02)
(ii) ඛ්‍යාල් ගීතය/ ලක්‍ෂණ ගීතය - ස්ථායි කොටස සඳහා ලකුණු (ස්වර ප්‍රස්ථාරය හා ගී පද සඳහා ලකුණු 06)
නැතහොත්
වාදිතයේ ස්ථායි කොටස හා තානාලංකාර 02 සඳහා ලකුණු 06
(iii) අදාල රාගයේ ආරෝහණ, අවරෝහණ, රාග ජාතිය හා එම රාගයේ අනුවාදී ස්වර ලිවීමට ලකුණු 04යි.

(03) (i) රාගයේ ලක්ෂණ පිළිබිඹු වීම, රාගයේ නාද මාලාව මගින්ම ගීතය නිර්මාණය වී තිබීම, අධ්‍යයනය කිරීමට පහසු වීම යන කරුණු 02ක් ලිවීමට ලකුණු 02යි.
(ii) දීප් චන්ද තාලය ප්‍රස්තාර කිරීමට. (ල. 04)
(iii) බිලාවල් හෝ භූපාලි යන රාගවලට ආවේණික ස්වර වලින් ස්වර රචනාව ලිවීමට ආවර්ත 02ට ලකුණු 06යි.

(04) (i) හටන්, ප්‍රශස්ති, වන්නම් ආදී වශයෙන් නම් කිරීමට ලකුණු 03යි.
(ii) ආසාතාත්මක, අනාසාතාත්මක, සාමූහික බව, ඒකල ගායනය යනාදී නිවැරදි කරුණු ගලපා ඇති විට ලකුණු 04)
(iii) තිත නම් කිරීමට ලකුණු 01 යි. ගී පද ප්‍රස්තාරයට ලකුණු 02 යි. ස්වර ප්‍රස්තාරය ලකුණු 02යි. මුළු ලකුණු 05යි.

(05) (i) a. නූර්ති - උත්තර භාරතීය සංගීතය / හින්දුස්ථානී සංගීතය
නාඩගම් - දක්ෂිණ භාරතීය සංගීතය / කර්ණාටක සංගීතය
b. නූර්ති - සර්පිනා / තබ්ලා නාඩගම් මද්දලය
c. වශ්වනාත් ලෞජී, ජටාශංකර්, අලගයිදු මුළු ලකුණු 06යි.
(ii) මාතෘකා දෙකක් සඳහා කරුණු ලිවීමට ලකුණු 02යි.
(iii) නූර්ති / නාඩගම් ගීතයක මුල් කොටසක පද නිවැරදිව ලිවීමට ලකුණු 04

(06) (i) | ධ ස ස | ස ස රි | ග - - | මග රිස රි
| ග ම ග | රි රි ග | රි ස - | - - - ලකුණු 06යි.
(ii) මධ්‍යම භාවයට
| රි ම ම | ම ම ප | ධ - - | නිධ පම ප | ලකුණු 2යි.

(iii) A. බේස් ක්ලේෆ් Bass clef / F clef
B. ඩොටඩ් මිනිම් / Dotted Minim
C. Tie / Tie note / Tied note / Bind
D. ට්‍රෙබල් ක්ලේෆ් / Treble clef / G clef ලකුණු 04යි. මුළු ලකුණු 12යි.

(07) ● මාතෘකා **01ක්** තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ය.
එක් මාතෘකාවක පිළිතුරක් සඳහා ලකුණු 12 කි.
i. එක් සංගීතඥයෙකුගේ සංගීත මෙහෙවර නිර්මාණය කළ ගීත, සංගීත ග්‍රන්ථ යනාදිය.
ii. ධ්වණි ගුණය, තාරතාවය, යන සංකල්ප දෙක උදාහරණ ලෙස විස්තරකර තිබීම.
iii. පරිගණකය ඇසුරෙන් සංගීතය පටිගත කිරීම.
• මෘදුකාංග දෙකක් නම් කිරීම. Cubas, Sound Forge, Fruity loops, Cool Edit, Audition යනාදිය.
iv. වෘත්තීන් මත, සමාජයීය අවශයතා හා විනෝදාස්වාදය මත ඇදහිලි හා විශ්වාසයන් මත ලෙස නම් කර තිබීම. එම ගී වර්ග 03ට අදාල ගීත වල මුල් ගී පාද තුනක් ලියා තිබීම මුළු ලකුණු 12යි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රයෝගික පරීක්ෂණය

| ප්‍රශ්න අංකය | ප්‍රශ්න හා අපේක්ෂිත ප්‍රතිචාර | ලකුණු |
|---|---|---|
| 01 1. | පරීක්ෂක විසින් අක්ෂර භාවිතයෙන් ("අ", "ල" වැනි) ගයනු ලබන ස්වර හඳුනාගෙන නම් කිරීම. | 04 |
| 2. | පරීක්ෂක විසින් ගයනු ලබන සරල ගීතය සඳහා වාදනයට සුදුසු හින්දුස්ථානී තාලය හඳුනාගෙන නම් කිරීම.<br>• ඉහත නම් කළ තාලයේ තාල පදය විභාග අනුව වෙන්කර ලිවීම.<br>• ඉහත තාලයට ගැලපෙන වෙනත් ගීතයක මුල් පාදයක් ලිවීම.<br>• ඉහත තාලයට සමාන දේශීය තිත නම් කිරීම. | 04 |
| 3. | පරීක්ෂක විසින් ගයනු ලබන නිර්දේශිත රාගයකට අයත් ස්වර සංගතියක් හෝ දෙකක් ශ්‍රවණය කර, රාගය හඳුනාගෙන එම රාගය ආශ්‍රිතව අසනු ලබන ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම.<br>• රාගයේ නම • අවරෝහණය • ආරෝහණය<br>• රාගයේ විශේෂ ලක්ෂණයක් | 04 |
| 02 | කැමති නිර්දේශිත රාගයක, ආරෝහණ, අවරෝහණ මධ්‍යලය ඛ්‍යාල්/ වාදිතයේ ස්ථායි, අන්තරා කොටස් සමග තානාලංකාර 02 ක් ගායනය/ වාදනය කිරීම. | 20 |
| 03 | ගුරුවරයා නම් කරන රාගයේ ලක්ෂණ ගීතය/ සර්ගම් ගීතයක ස්ථායි, අන්තරා කොටස් ගායනය/ වාදනය කිරීම එම රාගයට අයත් ස්වර ඛණ්ඩයක් අනුකරණය කිරීම. | 12 |
| 04 | • සරල ගී - නාට්‍ය ගී • නූර්ති ගී - නාඩගම් ගී • ග්‍රැමෆෝන් ගී - කණ්ඩායම් ගී අතරින් තෝරාගනු ලබන ගීත යුගලයකින් එක් ගීතයක් ගැයීම/ වැයීම | 16 |
| 05 | • ආසාතාත්මක/ අනාඝාතාත්මක කැමති ගැමි ගීතයක් ගායනය කිරීම<br>• හටන්, ප්‍රශස්ති හෝ වන්නම් යන එක් ගීතයක් ගායනය කිරීම. | 08<br>08 |
| 06 | • කැමති සංගීත භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය කිරීම. (ස්වර පුවරුව හැර)<br>නැත්නම්<br>තබ්ලාවෙන් නිර්දේශිත තාලයක ඨේකාව සමග බයදාවක්/ පල්ටාවක් වාදනය කිරීම.<br>• ස්වර පුවරුවෙන් කැමති ගීතයක් වාදනය කිරීම. | 12<br><br><br>12 |
| | මුළු ලකුණු | 100 |